සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
**Provincial Department of Education, Eastern Province**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු ඇගයීම - 2026 (ජුනි-ජූලි)
**General Certificate of Education (Adv.Level) Practice Assessment – 2026 (June-July)**

ජීව විද්‍යාව I
Biology I

**09 S I**

ශ්‍රේණිය - 13
Grade - 13

පැය දෙකයි
*Two hours*

**උපදෙස්:**
- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි අදාළ නිවැරදි අංකය මතකතිරයක් (X) යොදා දක්වන්න.

01. ජීවයේ මූලික ව්‍යුහමය ඒකකය සහ කෘත්‍යමය ඒකකය සඳහා නිදසුනක් ලෙස සැලකිය හැක්කේ,
    1. මානව මොළය
    2. ශාක පත්‍රය
    3. ඉයොසිනොෆිල
    4. හරිතලව
    5. නියුක්ලෙයික් අම්ල

02. ප්‍රෝටීනයක ප්‍රාථමික ව්‍යුහය සෑදීමේදී ඇමයිනෝ අම්ල සම්බන්ධ කරන්නේ පහත සඳහන් කවර බන්ධන වර්ගයක්ද?
    1. අයනික බන්ධන
    2. පොස්පොඩයිඑස්ටර බන්ධන
    3. හයිඩ්‍රජන් බන්ධන
    4. පෙප්ටයිඩ බන්ධන
    5. ග්ලයිකොසිඩික බන්ධන

03. ග්ලයිකොලිපිඩ සෑදීමට දායක වන්නේ පහත සඳහන් කුමන ඉන්ද්‍රිකා සංකලනයද?
    1. රළු අන්තඃප්ලාස්මීය ජාලිකා සහ සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා
    2. සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා සහ ගොල්ගී සංකීර්ණය
    3. සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා සහ ග්ලයොක්සිසෝම
    4. ග්ලයොක්සිසෝම සහ ගොල්ගී සංකීර්ණය
    5. සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා සහ ලයිසොසෝම

**අංක 04 සහ 05 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

A හා B ලෙස නම් කර ඇති ද්‍රාවණ දෙකක් සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකන්න.

- ද්‍රාවණ දෙක වෙන වෙනම බෙනඩික් පරීක්ෂාව සිදුකල විට කිසිදු ද්‍රාවණයක් පරීක්ෂාවට පිළිතුරු නොදේ.
- ද්‍රාවණ දෙක මිශ්‍රකර මඳ වේලාවක් තබා බෙනඩික් පරීක්ෂාව සිදු කල විට ගඩොල් රතු පැහැ අවක්ෂේපයක් ලැබේ.
- B ද්‍රාවණය බයියුරේට් පරීක්ෂාවට පිළිතුරු දෙයි.

Click & Join Our Telegram Channel

04. A සහ B ද්‍රාවණ විය හැක්කේ පිළිවෙලින්,
1. සුක්‍රෝස් , ඇමයිලේස්
2. සුක්‍රෝස් , HCl
3. පිෂ්ඨය , ඇමයිලේස්
4. පිෂ්ඨය , HCl
5. සුක්‍රෝස් , ඇල්බියුමින්

05. A ද්‍රාවණය හඳුනා ගැනීමට සිදු කල හැකි පරීක්ෂාවක් වන්නේ,
1. බයියුරේට් පරීක්ෂාව
2. සුඩාන් III පරීක්ෂාව
3. අයඩීන් පරීක්ෂාව
4. බෙනඩික් පරීක්ෂාව
5. මෙතිලීන් බ්ලූ පරීක්ෂාව

06. සෛල චක්‍රය සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ,
1. සෛල චක්‍රය පාලනය කරන පිරික්සුම් ස්ථාන $G_1$, $G_2$, M කලාවල ඇත.
2. මිනිස් දේහයේ බොහෝ සෛල G0 කලාවේ පවතී.
3. අන්ත කලාව අවසන් වන විට සෛල ප්ලාස්ම විභාජනය ආරම්භ වේ.
4. කේන්ද්‍ර දේහ ප්‍රති විරුද්ධ ධ්‍රැව වලට ලගා වීම ප්‍රාක් කලාවේදී සිදුවේ.
5. අන්ත කලාවේදි තර්කු ක්ෂුද්‍ර නාලිකා බහුඅවයවීකරණය වේ.

07. තරඟකාරී නිශේධක පිළිබඳව සත්‍ය ප්‍රකාශ වන්නේ,
1. උපස්ථර අණුවේ හැඩයට සහ ස්භාවයට බලපෑම් ඇතිකරයි.
2. ප්‍රතික්‍රියා උත්ප්‍රේරණයට වැදගත්වන ලිහිල්ව බැඳෙන කාබනික සංයෝග වේ.
3. උපස්තර අණු සාන්ද්‍රණය වැඩි කිරීමෙන් නිශේධක බලපෑම අවම කරගත හැකිය.
4. සක්‍රිය ස්ථානයේ හැඩය අප්‍රතිවර්ත්‍ය ලෙස වෙනස්කරයි.
5. එන්සයිම යාමක ස්ථානයට බැඳී සංඥා සම්ප්‍රේෂණය කරයි.

08. ප්‍රභාසංස්ලේෂණයේ ගෝලීය වැදගත්කමක් නොවන්නේ,
1. සියලුම ජීවීන්ගේ ශ්වසනයට අවශ්‍ය $O_2$ නිපදවීම.
2. පොසිල ඉන්ධන නිපද වීම.
3. වායුගෝලීය $O_2$ හා $CO_2$ සමතුලිතතාවය පවත්වා ගැනීම.
4. සියලුම ජීවීන් ප්‍රභාසංස්ලේෂණය මත යැපීම.
5. ගෝලීය උෂ්ණත්වය පවත්වා ගැනීම.

09. පහත සිදුවීම් සිදු වූ නිවැරදි අනුපිළිවෙල දැක්වෙන්නේ,
A. මුල්ම සිව්පාවුන් බිහිවීම.
B. ස්පොන්ජින් බිහිවීම.
C. මුල්ම ප්‍රොටිස්ටාවන් බිහිවීම.
D. සතුන් භෞමික සනාවාසීකරණය.
1. B,C,A,D
2. C,B,D,A
3. C,D,B,A
4. B,C,D,A
5. D,C,B,A

10. *Euglena*,
1. සෛල බිත්ති දරන අතර ඒකසෛලික වේ.
2. හරිතලව නොදරයි.
3. අක්ෂි ලප ඇත.
4. පූර්ණ වශයෙන් කශිකා වලින් වැසී ඇත.
5. ව්‍යාජ පාද සාදයි.

Click & Join Our Telegram Channel

11. ප්ලාන්ටේ රාජධානිය පිළිබඳව නිවරදි ප්‍රකාශය තෝරන්න.
    1. සියලුම විෂමබීජාණුක ශාක වලට සංසේචන සඳහා බාහිර ජලය අවශ්‍ය නොවේ.
    2. සියලුම සමබීජාණුක ශාක වල සනාල පටක නොමැත.
    3. පුෂ්ප හට නොගන්නා සියලුම ශාක වල බීජ නොමැත.
    4. සනාල පටක සහිත සියලුම ශාක වල ප්‍රමුඛ ජන්මාණු ශාක නොමැත.
    5. ප්‍රභාසංස්ලේෂක ජන්මානු ශාක සහිත සියලුම ශාක වල සනාල පටක නොමැත.

12. "සත්ත්වයා - ව්‍යූහය, කෘත්‍යය" අතර නොගැලපීමක් ඇති වරණය වන්නේ,
    1. වැරහිලි පණුවා - දැඩිකෙඳි, සංචරණය
    2. *Planaria* - ප්‍රාක්වෘක්කිකා, බහිස්‍රාවය
    3. මුහුදු තාරකාවා - නාළ පාද, භෝජනය
    4. ගැඩවිලා - අංශපාදිකා, සංසේචනය
    5. ලොඩියා - දංශක කෝෂය, ආරක්ෂාව

13. කෝඩේටා වර්ග සහ එම එක් එක් වර්ගයේ ලක්ෂණ පහත දැක්වේ. අසත්‍ය "වර්ගය - ලක්ෂණය" සංකලනය තෝරන්න.
    1. කොන්ඩ්‍රික්තියේස් - කුටීර දෙකක හෘදය, බාහිර සංසේචනය
    2. රෙප්ටිලියා - කුටීර තුනක හෘදය, අස්ථිභවනය වූ පිටසැකිල්ල
    3. ආවේස් - කුටීර හතරක හෘදය, කීට අවස්ථා නොතිබීම.
    4. මැමේලියා - කුටීර හතරක හෘදය, අණ්ඩජ හෝ ජරායුජ
    5. ඇම්ෆිබියා - කුටීර තුනක හෘදය, බාහිර කනක් නොපිහිටීම.

14. ඒකබීජ පත්‍රී ශාක කඳක දැකිය නොහැක්කේ,
    1. ප්‍රාථමික ශෛලම
    2. අධ්‍යස්තර කොපුව
    3. මජ්ජාව
    4. මෘදුස්තර සෛල
    5. සහචර සෛල

15. ප්ලෝයම පටක පිළිබඳව වැරදි ප්‍රකාශය වන්නේ පහත සඳහන් ඒවා වලින් කුමක්ද?
    1. සහචර සෛල වල ඝන සෛල ප්ලාස්මයක් සහ මධ්‍යයේ පිහිටි පැහැදිලි න්‍යෂ්ටියක් ඇත.
    2. පෙනේර නල සෛලය සහ සහචර සෛලය අතර ප්ලාස්මඩෙස්මාටා රාශියක් ඇත.
    3. පෙනේර නල සෛලය සහ සහචර සෛලය එක් මව් සෛලයකින් ව්‍යුත්පන්න වේ.
    4. ප්ලෝයම පටකය සැමවිටම ශෛලම පටකයට පිටතින් පිහිටයි.
    5. සහචර සෛල ජල සන්නයනය සිදු නොකරයි.

16. ශාක තුල සිදුවන පහත ක්‍රියාවලි අතරින් අක්‍රීයව සිදුවන ක්‍රියාවලි වන්නේ,
    - A. ප්ලෝයම භර කිරීම
    - B. මූලකේෂ මගින් K+ අවශෝෂණය
    - C. පාලක සෛල තුලට K+ ඇතුළු වීම.
    - D. ශෛලම වාහිනි තුලින් ඛනිජ අයන පරිවහනය
    1. A හා B පමණි.
    2. A හා C පමණි.
    3. B හා C පමණි.
    4. A හා D පමණි.
    5. සියල්ලම

17. මේරූ පත්‍රවල හරිතක්ෂය ඇති වීමට බලපාන මූලද්‍රව්‍යයක් වන්නේ,
    1. Mg
    2. Fe
    3. S
    4. Ca
    5. K

Click & Join Our Telegram Channel

18. පුටිකා උත්ස්වේදනය සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

A. ශාකයක 75% ක් පමණ ජලය පිටවන්නේ පුටිකා උත්ස්වේදනය මගිනි.
B. පත්‍රමධ්‍ය සෛල හරහා මාර්ග තුන ඔස්සේම ජලය ගමන් කරයි.
C. පත්‍ර තලයට වහාම ආසන්නව තුනී, ගලා නොයන වායු ස්ථරයක් ඇති වේ.
D. නිසල වාතයේදී යාබද පුටිකා වල වූ විසරණ කවච එකිනෙක අතිපිහිත නොවේ.

1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4. A,B හා C පමණි.
5. සියල්ලම

19. මුලෙහි ධන ගුරුත්වාවර්තනය සිදු වීමේදී,

1. මුලේ සෛල විභාජනය වන කලාපයේ යටි පැත්තේ $Ca^{2+}$ සහ ඔක්සින ඒකරාශි වේ.
2. අධික ඔක්සින සාන්ද්‍රණය මගින් මුලෙහි සෛල දික්වීම නිශේධනය කරයි.
3. මූලාග්‍ර කොපුවේ පහල කොටසේ $Ca^{2+}$ ප්‍රතිව්‍යාප්තිය සිදු වීමෙන් තුලාශ්ම ඒකරාශී වේ.
4. මුලෙහි උඩ පැත්තේ සෛල වඩාත් සෙමින් දිගු වීම සිදුවේ.
5. තුලාශ්ම සෛල පුරා විසිරී තැන්පත් වේ.

20. මෙම අපිච්ඡද පටකය පිහිටි ස්ථානයක් වන්නේ,



1. මුඛ ආස්තරණය
2. වෘක්ක නාලිකා
3. ආන්ත්‍රික ආස්තරණය
4. රුධිර කේශනාලිකා
5. නාස් මාර්ගය

21. අක්මා අනුඛණ්ඩිකාව සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ,

1. අක්මාවේ කෘත්‍යමය ඒකකය වේ.
2. සනාකාර හැඩැති හෙපැටොසයිට වලින් සෑදී ඇත.
3. සෛල ස්තර දෙකක් අතර කෝටරාභ පිහිටයි.
4. කෝටරාභ වල ආස්තරණයේ යාකෘතික මහා භක්ෂාණු සෛල පවතී.
5. කෝටරාභ තුලින් පෝෂක ද්‍රව්‍ය අධික රුධිරය මධ්‍ය ශිරාව දක්වා ගලා යයි.

22. පහත ප්‍රෝටීන ජීරණයට ආදාල A හා B එන්සයිම දෙක පිලිවෙලින් දැක්වෙන්නේ,

ප්‍රෝටීන —A→ කුඩා පොලිපෙප්ටයිඩ

වඩාත් කුඩා පොලිපෙප්ටයිඩ —B→ කුඩා පෙප්ටයිඩ + ඇමයිනෝ අම්ල

1. ට්‍රිප්සින්, අග්න්‍යාශයික කාබොක්සිපෙප්ටයිඩේස්
2. පෙප්සින්, ට්‍රිප්සින්
3. කයිමෝට්‍රිප්සින්, ඇමයිනෝපෙප්ටිඩේස්
4. පෙප්සින්, අග්න්‍යාශයික කාබොක්සිපෙප්ටයිඩේස්
5. අග්න්‍යාශයික කාබොක්සිපෙප්ටයිඩේස්, ඇමයිනෝපෙප්ටිඩේස්

23. මානව හෘදයේ,

1. එන්ඩොකාඩියම හෘත් පේශි පටකයෙන් සෑදී ඇත.
2. පෙරිකාඩියම අභ්‍යන්තරම ස්ථරයයි.
3. දකුණු කර්ණිකාව සහ දකුණු කෝෂිකාව අතර මයිට්‍රල් කපාටය ඇත.
4. කර්ණිකාවල අභ්‍යන්තර බිත්තියේ පිහිටන පිටිකා පේශි හෘද් රජ්ජු සමඟ සම්බන්ධව ඇත.
5. මහා ධමනියෙහි, මහා ධමනි කපාටයට වහාම පසුව බෙදුනු කිරීටක ධමනි යුගලය පිහිටයි.

Click & Join Our Telegram Channel

24. රුධිරය තුල ශ්වසන වායු පරිවහනය සම්බන්ධ අසත්‍ය වන්නේ,
   1. $CO_2$ වැඩිම ප්‍රතිශතයක් පරිවහනය වන්නේ කාබෝඇමයිනෝහිමොග්ලොබින් ලෙසය.
   2. එක් හිමොග්ලොබින් අණුවකට $O_2$ අණු 4ක් පරිවහනය කල හැක.
   3. හිමොග්ලොබින් යනු උප ඒකක 4ක් දරණ චාතුර්ථ ප්‍රෝටීනයකි.
   4. $CO_2$ වලින් 7%ක් පමණ නිදහස් වායු ලෙසම පරිවහනය වේ.
   5. හිමොග්ලොබින් සමඟ $O_2$ ප්‍රතිවර්ත්‍ය ලෙස බැඳී ඔක්සිහිමොග්ලොබින් සාදයි.

25. සතුන්ගේ දැකිය හැකි ශ්වසන ව්‍යූහ පිළිබඳව නිවරැදි සංකලනය වන්නේ,
   1. බාහිර ජලක්ලෝම - කරදිය ඇනලීඩාවන්
   2. අභ්‍යන්තර ජලක්ලෝම - නිඩාරියාවන්
   3. ශ්වාසනාල පද්ධතිය - ගෝනුස්සන්
   4. පෙනහැලි - මත්ස්‍යයින්
   5. පත්පෙනහැලි - කෘමීන්

26. ඇදුම රෝගය සඳහා හේතුවන්නේ,
   1. *Mycobacterium tuberculosis* බැක්ටීරියාව ආසාදනය වීම.
   2. වාතයේ අවලම්බිත අංශු ගර්ත කේශනාලිකා මත තැන්පත් වීම.
   3. ශ්වසන මාර්ගයේ සිනිඳු පේශි ක්ෂණිකව සංකෝචනය වීම.
   4. අධික ලෙස ශ්ලේෂ්මල ස්‍රාවය වීම.
   5. රුධිරය තුල ඔක්සිහිමොග්ලොබින් සෑදීම නිශේධනය වීම.

27. හෝමෝනය සහ කෘත්‍යය නිවැරදිව ගලපා ඇත්තේ,
   1. TRH - තයිරොයිඩ හෝමෝන ස්‍රාවය උත්තේජනය.
   2. කෝටිසෝල් - කෙටිකාලීන ආතති ප්‍රතිචාර වලට මැදිහත් වීම.
   3. LH - පීත දේහයෙන් ප්‍රොජෙස්ටරෝන් ස්‍රාවය උත්තේජනය
   4. කැල්සිටොනින් - රුධිරයේ Ca මට්ටම වැඩි කිරීම.
   5. තයිමොසීන් - සහජ ප්‍රතිශක්තිය යාමනය කිරීම.

28. මානව ස්ත්‍රී ප්‍රජනක චක්‍රය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,
   1. ස්‍යූනික අවධියේදී වර්ධනය වන ස්‍යූනිකා මඟින් ඊස්ට්‍රඩියෝල් සහ ප්‍රොජෙස්ටරෝන් නිපදවයි.
   2. ලූටීල අවධිය අවසානයේදී ඊස්ට්‍රඩියෝල් සහ ප්‍රොජෙස්ටරෝන් මට්ටම පහළ බසින අතර FSH ස්‍රාවය වැඩි වීමට පටන් ගනී.
   3. ගර්භාෂයේ ප්‍රගුණන අවධියේදි ආරම්භ වන එන්ඩෝමෙට්‍රියමෙ වර්ධනය, ස්‍රාවී අවධියේදී අඩුවීමට පටන් ගනී.
   4. FSH හා LH මට්ටම සීඝ්‍රයෙන් පහළ බැසීම නිසා එන්ඩොමෙට්‍රියම ගැලවී ගොස් ආර්ථවය සිදුවේ.
   5. ආර්ථවහරණයේදි පූර්ව පිටියුටරියෙන් FSH හා LH නිපදවීම නතර වේ.

29. ද්‍රවස්ථිතික සැකිල්ල පිළිබඳව වැරදි වන්නේ,
   1. තරලය පිරි කුහර මෙලෙස ක්‍රියා කරයි.
   2. අත්‍යාවශයෙන්ම සීලෝමයක් පැවැතිය යුතුය.
   3. සතුන්ගේ සංචරණයට උපකාරී වේ.
   4. නෙමටෝඩාවන්වද මේ ආකාර සැකිල්ලක් දරයි.
   5. පේශී සංකෝචනය සහ තරල පීඩනයේ සම්ප්‍රයුක්ත ඵලය උපයෝගී වේ.

30. කංකාල පේශියක් සංකෝචනය වන විට සිදු නොවන්නේ,
   1. ඇක්ටින් සූත්‍රිකා වල බන්ධන ස්ථාන $Ca^{2+}$ අයන මඟින් නිදහස් වීම.
   2. මයෝසීන් හිස් ඇක්ටින් වලට බැඳී හරස් පාලම් සෑදීම.
   3. ADP හා පොස්ෆේට් නිදහස් කරමින් මයෝසින් හිස නැවත අඩු ශක්ති මට්ටමට පැමිණීම.
   4. ඇක්ටින් සහ මයෝසීන් සූත්‍රිකා මධ්‍ය දෙසට සර්පණ වීම.
   5. Z රේඛා අතර පරතරය අඩුවීම.

Click & Join Our Telegram Channel

31. පෙළවැල සටහනක බලපෑමකට ලක්වූ ස්ත්‍රියක හා නිරෝගී පුරුෂයෙකුගේ විවාහය නිරූපණය කරන්නේ,

1. 
2. 
3. 
4. 
5. 

32. මෙන්ඩලීය නොවන ආවේණික රටා පිළිබඳව වැරදි වන්නේ,
   1. බහුජාන ආවේණියේදී වෙනස් ජාන පථවල ජාන දෙකකට වඩා වැඩි ගණනක සමුච්චිත ප්‍රකාශනය සිදුවේ.
   2. නිලීන අභිබවනයේදී නිලීන සමයුග්මක ඇලීලයක් මඟින් වෙනත් ඇලීලයක් නිශේධනය කරයි.
   3. සහප්‍රමුඛතාව යනු විෂමයුග්මක අවස්ථාවේ රූපානුදර්ශය ඇති කිරීමට ඇලීල දෙකම සමානව දායක වීමයි.
   4. ප්‍රතිබද්ධයේදී සෑම විටම ජනක රූපානු දර්ශ පමණක් ප්‍රතිඵල වේ.
   5. බහුකාර්යතාවය යනු තනි ජානයක වෙනස් වීමෙන් රූපානුදර්ශ රාශියක ප්‍රතිඵල වීමයි.

33. ජාන තාක්ෂණයේදී රූපයේ දැක්වෙන උපකරණය භාවිතා කරන්නේ,



   1. DNA අනුක්‍රම නිර්ණය සඳහා
   2. DNA විසංගමනය සඳහා
   3. සෛල තුලට DNA ඇතුළු කිරීම සඳහා
   4. නාලස්ථව DNA පිටපත් කිරීම සඳහා
   5. DNA විශ්ලේෂණය සඳහා

34. ප්‍රතිලේඛනය යනු,
   1. m-RNA දාමයක් සෑදීමට අච්චුව ලෙස ක්‍රියා කරන DNA දාමයයි.
   2. Pre-mRNA අණුවයි.
   3. පරිණත mRNA වේ.
   4. DNA හී ඉන්ට්‍රෝන සියල්ලේ එකතුවයි.
   5. කෘත්‍යමය නොවන පොලිපෙප්ටයිඩ දාමයයි.

35. පරිසර පද්ධතියක,
   1. ද්‍රව්‍ය හා ශක්තිය චක්‍රීයව ගලායයි.
   2. ජෛව ස්කන්ධ පිරමීඩ සෑම විටම උඩුකුරු වේ.
   3. සෑම ආහාර දාමයකම ප්‍රාථමික නිශ්පාදකයා හරිත ශාක වේ.
   4. ඕනෑම ආහාර දාමයක පෝෂී මට්ටම් සංඛ්‍යාව 4 හෝ 5 කට සීමා වේ.
   5. ආහාර දාමයක එක් පෝෂී මට්ටමකදී විභව ශක්තියෙන් 10%ක් පමණ හානි වේ.

36. මෙම ප්‍රශ්නය පහත ලක්ෂණ මත පදනම් වේ.
   - A. බොහෝ ශාක ප්‍රභාසංස්ලේෂණයේදී $C_4$ මාර්ගය දක්වයි.
   - B. පසේ ස්ථිරව මිදිනු නිත්‍යතුහින ස්ථරයක් දැකිය හැක.
   - C. ගින්නට ප්‍රතිරෝධී මුල්.
   - D. ඉදිකටු හැඩැති පත්‍ර දරන ශාක.

   ඉහත දක්වා ඇති ලක්ෂණ දැකිය හැකි බියෝම අනුපිළිවෙලින් දැක්වෙන්නේ,
   1. කාන්තාර, සෞම්‍ය කලාපීය තෘණභූමි, සැවානා, සෞම්‍ය කලාපික පළල් පත්‍ර වනාන්තර
   2. සැවානා, තුන්ද්‍රා, කාන්තාර, සෞම්‍ය කලාපීය තෘණභූමි
   3. කාන්තාර, සෞම්‍ය කලාපීය තෘණභූමි, සැවානා, කේතුධර වනාන්තර
   4. වැපරාල්, සෞම්‍ය කලාපික පළල් පත්‍ර වනාන්තර, සැවානා, තුන්ද්‍රා
   5. කාන්තාර, තුන්ද්‍රා, වැපරාල්, කේතුධර වනාන්තර

37. ක්ෂුද්‍ර ජීවීන්ගේ තරම (ප්‍රමාණය) අනුව වැඩිවෙන අනුපිළිවෙල දැක්වෙන්නේ,
   1. වයිරොයිඩ, ප්‍රියෝන, වෛරස, බැක්ටීරියා, මයිකෝප්ලාස්මා
   2. ප්‍රියෝන, වයිරොයිඩ, වෛරස, මයිකෝප්ලාස්මා, බැක්ටීරියා
   3. වෛරස, ප්‍රියෝන, ෆයිටොප්ලාස්මා, යීස්ට, බැක්ටීරියා
   4. වෛරස, වයිරොයිඩ, බැක්ටීරියා, මයිකෝප්ලාස්මා, යීස්ට
   5. ප්‍රියෝන, ෆයිටොප්ලාස්මා, වෛරස, වයිරොයිඩ, බැක්ටීරියා

Click & Join Our Telegram Channel

38. පැස්ටරීකරණය සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ,
   1. නිෂ්පාදිතයේ රස, වයනය හා පෝෂක අන්තර්ගතයට හානිය අවම වන පරිදි තාපය යෙදීම සිදු කරයි.
   2. ව්‍යාධිජනක ක්ෂුද්‍රජීවීන් ඉවත් කිරීමට හා ක්ෂුද්‍රජීවීන් සංඛ්‍යාව අඩුකරගැනීමට යොදා ගනී.
   3. අධි උෂ්ණත්ව කෙටි කාලීන (HTST) පැස්ටරීකරණයේදී $72^0C$ උෂ්ණත්වයේ තත්පර 15ක් පවත්වා ගනී.
   4. අඩු උෂ්ණත්ව දිගු කාලීන (LTLT) පැස්ටරීකරණයේදී $63^0C$ උෂ්ණත්වයේ තත්පර 30ක් පවත්වා ගනී.
   5. ආහාර පරිරක්ෂණ ක්‍රමයක් ලෙස භාවිතා වේ.

39. කර්මාන්ත ක්ෂුද්‍රජීවී විද්‍යාවෙ භාවිත පිළිබඳව නිවරැදි වන්නේ,
   1. විටමින් $B_{12}$ නිෂ්පාදනය සඳහා *Propionibacterium sp*. යොදා ගනී.
   2. විනාකිරි නිශ්පාදනය සම්පූර්ණයෙන්ම නිර්වායු තත්ව යටතේ සිදුවේ.
   3. ජීව වායු නිශ්පාදනයේදී ඇසිටොජෙනික බැක්ටීරියා මඟින් මීතේන් නිපදවේ.
   4. *Thiobacillus ferroxidans* මඟින් ලෝපස් වල Cu 95% ක් පමණ වෙන් කරගත හැක.
   5. ඉන්වර්ටේස් එන්සයිමය වාණිජව බහුලව නිපදවන්නේ *Rhizopus sp*. මඟිනි.

40. විසිතුරු මසුන්ට වැලදෙන රෝගය හා රෝග කාරකය ගැලපෙන්නේ,
   A. කොලම්නාරිස් රෝගය - වර්ම පැතැල්ලන්
   B. රක්තපාත - සෙප්ටිසීමියා බැක්ටීරියා
   C. සුදු පුල්ලී රෝගය - ඒක සෛලික බාහිර පරපෝෂිතයින්
   1. A පමණි.
   2. B හා C පමණි.
   3. A හා B පමණි.
   4. C පමණි.
   5. සියල්ල නොගැලපේ.

**අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවරැදිය. කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවරැදි ද යන්න පළමුවෙන්ම විනිශ්චය කර ගන්න. ඉන්පසු දී ඇති උපදෙස් අනුව නිවරැදි අංකය තෝරන්න.**

| උපදෙස් සැකෙවින් | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| A,B,D නිවරැදි ය. | A,C,D නිවරැදි ය. | A,B නිවරැදි ය. | C,D නිවරැදි ය. | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවරැදි ය. |

41. එක් ග්ලූකෝස් අණුවක් සඳහා ක්‍රෙබ්ස් චක්‍රයේදී නිපදවෙන එල සංඛ්‍යාවන් නිවරැදිව දැක්වෙන්නේ,
   A. $CO_2$ අණු දෙකක්,
   B. NADH අණු හයක්,
   C. $FADH_2$ අණු තුනක්,
   D. ATP අණු දෙකක්,
   E. $O_2$ අණු හතරක්,

42. පහත දක්වා ඇති ලක්ෂණ අතුරින් කොන්ඩ්‍රික්තියේස්, ඔස්ටෙයික්තියේස් සහ ඇම්ෆිබියා යන වර්ග තුනෙහිම දැකිය හැකි ලක්ෂණය/ ලක්ෂණ වන්නේ,
   A. චලතාපී බව
   B. ජලක්ලෝම මඟින් ශ්වසනය
   C. බාහිර සංසේචනය
   D. කවච සහිත බිත්තර
   E. අස්ථිමය සැකිල්ල

43. පූර්ණ ශූන සෛලයක්, $\psi_S$ = -1.8 MPa වූ විවෘත ද්‍රාවණයක ගිල්වා සමතුලිත වීමට තබයි. මෙම සෛලය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ, (සෛලයේ $\psi_S$ = -2.4 MPa)
   A. ආරම්භයේදී සෛලයේ $\psi_P$ = +2.4 MPa වේ.
   B. ද්‍රාවණය තුළදී සෛලය බාහිරාසෘතියට ලක්වේ.
   C. ද්‍රාවණය තුළදී සෛලය අන්තරාසෘතියට ලක්වේ.
   D. සමතුලිතවීමෙන් පසු සෛලයේ $\psi_P$ = +0.6 MPa වේ.
   E. සමතුලිත වූ පසු ද්‍රාවණයේ සහ සෛලයේ ජල විභවය සමාන අතර එක $\psi$ = -0.9 MPa වේ.

Click & Join Our Telegram Channel

44. ශාක තුල ජලය උඩුකුරු පරිවහනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
   A. උඩුකුරු පරිවහනය සඳහා අධික සංසක්ති හා ආසක්ති බල හා උත්ස්වේදන චූෂණය බලපායි.
   B. ශෛලම යුෂය සාමාන්‍යයෙන් සෘණ පීඩනයක් යටතේ පවතී.
   C. ඉහල සංසක්තිය නිසා ජල අණු සෙලියුලෝස් අණුවලට ආකර්ශණය වේ.
   D. ශෛලම තුල ජලය පරිවහනය සඳහා ජල විභව අනුක්‍රමණය අත්‍යාවශ්‍ය වේ.
   E. ශාක වලට ශෛලම යුෂය එසවීම සඳහා ශක්තිය අවශ්‍ය වේ.

45. අධ්‍යාතතිය සෑදීමට හේතුවන සාධකය/සාධක වන්නේ,
   A. මධුමේහය
   B. ලුණු පරිභෝජනය
   C. දුම් බීම
   D. පවුල් ඉතිහාසය
   E. ඩෙංගු රක්තපාත උණ

46. මිනිසාගේ T වසා සෛල,
   A. තයිමස තුලදි විකසනය සම්පූර්ණ කර ගනී.
   B. ප්‍රධාන වශයෙන්ම සෛල මාධ්‍ය ප්‍රතිශක්ති ප්‍රතිචාර ඇති කරයි.
   C. ප්ලාස්ම පටලය මත එපිටෝප දරයි.
   D. ස්භාවික නාශක සෛල සහ ආධාරක සෛල බවට විභේදනය විය හැක.
   E. රුධිරයේ සිටින ව්‍යාධිජනකයින් උදාසීන කිරීම සහ අක්‍රිය කිරීම සිදුකරයි.

47. වක්කාණුවේ අවිදූර සංවලිත නාලිකාවේදී ස්‍රාවය වන ද්‍රව්‍යයක්/ද්‍රව්‍ය වන්නේ,
   A. $H^+$
   B. $NH_3$
   C. $Na^+$
   D. $HCO_3^-$
   E. $K^+$

48. එක් රූපාණු දර්ශයක් නිර්ණය කිරීමට ජාන දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් සහභාගී වන අවස්ථාවන් වන්නේ,
   A. *Mirabilis jalapa* ශාකයේ මල්වල වර්ණය තීරණය වීම.
   B. මිනිසාගේ AB රුධිර ගණය ඇතිවීම.
   C. Sweet pea ශාකයේ මල්වල වර්ණය තීරණය වීම.
   D. මිනිසාගේ සමේ වර්ණය තීරණය වීම.
   E. කුකුලන්ගේ පිහාටු වල වර්ණය තීරණය වීම.

49. කාර්මික අපජලය ප්‍රාථමික පිරියම් කිරීම හා ආදාල වන්නේ,
   A. අවසාදක තටාක තුල ඝන ද්‍රව්‍ය තැන්පත් වීම.
   B. වැලි ඉවත් කිරීම.
   C. රොන්බොර එකතු කර ඉවත් කිරීම.
   D. පාෂාණමය ද්‍රව්‍ය තට්ටුවක් මතට අපජලය සෙමින් ඉසීම.
   E. ඓන්ද්‍රිය ද්‍රව්‍ය 35% - 45% ත් ප්‍රමාණයක් වෙනස් වීම.

50. අම්ල වැසි සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,
   A. පොසිල ඉන්ධන දහනයෙන් පිටවන $CO_2$ සහ නයිට්‍රජන් වල ඔක්සයිඩ ප්‍රධාන වශයෙන් බලපායි.
   B. අම්ල වැසි වල pH අගය 5.6 ට අඩුවේ.
   C. අම්ල වැසි මගින් දේශගුණික රටා වෙනස් කරයි.
   D. Pb, Hg වැනි බැරලෝහ පස තුලට ක්ෂීරණය වීමට අම්ල වැසි හේතුවේ.
   E. අම්ල වැසි මගින් වනාන්තර වලට එතරම් හානියක් නැතත් කුඩා පැළැටි වලට සෘජුවම බලපායි.

***

Click & Join Our Telegram Channel

සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු ඇගයීම - 2026 (ජුනි-ජූලි)
General Certificate of Education (Adv.Level) Practice Assessment – 2026 (June-July)

ජීව විද්‍යාව II
Biology II

**09 S II**

ශ්‍රේණිය - 13
Grade - 13

පැය තුනයි
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
*Additional Reading Time - 10 minutes*

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නම : ........................................

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 9 කින් සහ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර කොටස් දෙකට ම නියමිත කාලය පැය තුනකි.

**A කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක 2 - 8)**

- ප්‍රශ්න හතරට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නො වන බව ද සලකන්න.

**B කොටස - රචනා (පිටු අංක 9)**

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A සහ B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |

එකතුව

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංක

| | |
|---|---|
| උත්තර පත්තර පරීක්ෂක 1 | |
| උත්තර පත්තර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ : | |
| අධීක්ෂණය කළේ : | |



Click & Join Our Telegram Channel

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

**(එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ප්‍රමාණය 100 කි.)**

**01. A.**

**I.** නියුක්ලියෝටයිඩයක අඩංගු සංරචක 3 නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**II.** ජීවී සෛල තුල පහත අවස්ථාවලදී භාවිතාවන ඩයිනියුක්ලියෝටයිඩය බැගින් ලියන්න.

**a.** ස්වායු ශ්වසනය .......................................................................................

**b.** ප්‍රභාසංස්ලේෂණය .......................................................................................

**III.** ඌනන විභාජනයේදී ප්‍රවේණික ප්‍රභේදනය ඇති කිරීමට දායක වන සිදුවීම් 3ක් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**IV.** C4 ශාකවල පත්‍රමධ්‍ය සෛල වල දක්නට ලැබෙන $CO_2$ ප්‍රතිග්‍රාහකයා සහ ඊට ආදාල එන්සයිමය ලියන්න.

**a.** $CO_2$ ප්‍රතිග්‍රාහකයා .......................................................................................

**b.** එන්සයිමය .......................................................................................

**V.** පහත සඳහන් විස්තර වලට ආදාල ප්‍රොටිස්ටා රාජධානියේ සාමාජිකයන්ගේ සන නාම ලියන්න.

**a.** ජවිකාව සහිත ද්විනාෂ්ටික .......................................................................

**b.** ව්‍යාජ පාද දරන ඒක සෛලික .......................................................................

**c.** සෛල බිත්ති රහිත හරිතලව දරන .......................................................................

B.

**I.** ශාකවල විභාජක පටකවල වර්ධනය සඳහා ආදාල වන ක්‍රියාවලි 3 ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**II.** ශාකවල පහත සඳහන් පටක ඇති කරන විභාජක පටක නම් කරන්න.

**a.** ද්විතීක ශෛලම පටකය .......................................................................................

**b.** මුලේ බාහිකය .......................................................................................

**c.** කඳේ මජ්ජාව .......................................................................................

**d.** කඳේ ප්‍රාථමික ශෛලම .......................................................................................

**III.** පහත සඳහන් විස්තර වලට ආදාල ශාකවල සන නාමය ලියන්න.

**a.** ජණ්මාතෘ ශාකය ප්‍රමුඛ වූ ද්විගෘහී ජන්මාණු ශාක සහිත ...................................................

**b.** බීජ රහිත විෂමබීජාණුකතාවය දක්වන ...................................................

**c.** බීජ දරන ශෛලම පටකයේ වාහිනී නොදරන ...................................................

**IV.** පහත සඳහන් ආකාර හා ස්ථාන වලින් ජලය පිටවීමේ ක්‍රමයන් නම් කරන්න.

**a.** පරිණත කඳෙන් ජලය වාශ්ප ලෙස ...................................................

**b.** පත්‍රවල ඇති පූටිකා තුලින් ජලය වාශ්ප ලෙස ...................................................

**c.** පත්‍රවල ඇති ජලපීදූ තුලින් ජලය ද්‍රවලෙස ...................................................



Click & Join Our Telegram Channel

**V.** සපුශ්ප ශාක වල පුංජන්මාණු ශාකය වර්ධනය වන ස්ථානය කුමක්ද?

.................................................................................................................................

C.

**I.** ස්නායු පටකයේ ප්‍රධාන සෛල ආකාර දෙක ලියා ඒවායේ කාර්යයන් ලියන්න.

| සෛල ආකාරය | කාර්යය |
|---|---|
| ........................................ | .............................................................................................. |
| ........................................ | .............................................................................................. |

**II.**

**a.** කුඩා අන්ත්‍රයේ ප්‍රධාන කොටස් 3 නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**b.** ඉහත (a) හි සඳහන් කොටස් අතරින් දිගින් අඩුම කොටස නම් කරන්න.

.................................................................................................................................

**III.** ආමාශ ආස්තරණය පෙප්සින් මගින් ජීරණය වැළැක්වීමට ඇති අනුවර්තන දෙකක් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

**IV.** යාකෘත් අග්න්‍යාශයික ප්‍රණාලය සෑදෙන ආකාරය ලියන්න.

.................................................................................................................................

**V.** ආහාර ජීරණය යාමනය කරන ප්‍රධාන ආකාර 2 නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

**02.** A.

**I.** හෘද බිත්තියේ ප්‍රධාන පටක ස්තර පිටත සිට ඇතුලට පිළිවෙලින් නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**II.** පහත සිදුවීම් සිදුවන්නේ හෘද් චක්‍රයේ කවර අවධි වලදී දැයි ලියන්න.

- **a.** ද්විතුණ්ඩ කපාටය විවෘත වීම. ..................................................
- **b.** අඩසඳ කපාටය විවෘත වීම. ..................................................
- **c.** ත්‍රිතුණ්ඩ කපාටය විවෘත වීම. ..................................................

**III.** මානව බාහිර ආරක්ෂණයේ ප්‍රධාන ආකාර නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**IV.** ඉන්ටර්ෆෙරොන් වල කාර්යයන් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

**V.** පටකයක් තුවාල වූ විට ස්‍රාවය වන හිස්ටැමින් වල ප්‍රධාන කාර්යයන් 2 ක් ලියන්න.



Click & Join Our Telegram Channel

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

B.

I. අක්‍රිය ප්‍රතිශක්තිය යනු කුමක්ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

II. සක්‍රිය ප්‍රතිශක්තියේදී එන්නත් ලෙස භාවිතා කරන ද්‍රව්‍ය මොනවාද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

III. ප්‍රතිශක්ති ඌනතා රෝග යනු කවරේද?

..............................................................................................................................

..............................................................................................................................

IV. ගුච්ඡික පෙරනයෙන්,

a. වැඩිම ජල ප්‍රතිශෝෂණයක් සිදු කරන වෘක්කාණුවේ කොටස නම් කරන්න.

..............................................................................................................

b. ජල ප්‍රතිශෝෂනය කරන ආකාරය නම් කරන්න.

..............................................................................................................

V. මුත්‍රා සෑදීමේදී ස්‍රාවයේදී සිදුවන දෑ පැහැදිලි කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

C.

I. පහත පද හඳුන්වන්න.

c. කලපු

..............................................................................................................

..............................................................................................................

d. විල්ලු

..............................................................................................................

..............................................................................................................

II. අභ්‍යන්තර මිරිදිය වගුරුබිම් යනු මොනවාද?

..............................................................................................................................

..............................................................................................................................

III. ජෛව විවිධත්වයේ පාරිසරික සේවා වටිනාකම් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

IV. ඕසෝන් ස්ථරය ක්ෂය වීම මඟින් සාගර ජීවීන්ට බලපෑම් ඇතිවේ. එහි අහිතකර බලපෑම් ලියන්න.



Click & Join Our Telegram Channel

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

V. ගෝලීය උණුසුම ඉහල යාමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

03. A.

I. මානව දේහයේ ඇති ප්‍රතිග්‍රාහක වර්ග 5ක් නම් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

II. පහත සදහන් හෝමෝන නිපදවන නිර්නාල ග්‍රන්ථි නම් කරන්න.

a. ග්ලූකගන් ..............................................................................

b. කෝටිසෝල් ..............................................................................

c. තයිරොක්සින් ..............................................................................

d. ADH ..............................................................................

III. පහත සදහන් තත්ව වලට හේතුව කෙටියෙන් ලියන්න.

a. අධි තයරොයිඩතාවය

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

b. මධුමේහය I

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

IV. මෙම රූපයෙන් දැක්වෙන්නේ මානව කශේරුකාවක රූපසටහනකි.



a. මෙය කවර කශේරුකා වර්ගයට අයත්ද? ..............................................................

b. එම නිගමනය සදහා යොදාගත් ලක්ෂණය කුමක්ද?

..............................................................................................................................

c. මෙම කශේරුකාව උත්තරව සන්ධානය වන අස්ථිය නම් කරන්න.

..............................................................................................................................

d. මෙම කශේරුකාවට අධරව සන්ධානය වන අස්ථිය නම් කරන්න.

..............................................................................................................................

V. පහත සදහන් කශේරුකා සංඛ්‍යා ලියන්න.

a. ග්‍රෛවී කශේරුකා ..............................................



Click & Join Our Telegram Channel

b. උරස් කශේරුකා ..............................

c. කටි කශේරුකා ..............................

**B**

I. ස්නායු සම්ප්‍රේශකයක් යනු කුමක්ද?

..............................................................................................

..............................................................................................

..............................................................................................

II. සුලභ ස්නායු සම්ප්‍රේෂක නම් කරන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

III.

d. අධික ආලෝක තිව්‍රතාවයේදී කණීනිකාවේ චලනය කෙසේ සිදුවේද?

..............................................................................................

..............................................................................................

..............................................................................................

e. එම ක්‍රියාවේ වැදගත්කම ලියන්න.

..............................................................................................

IV. පෙනිමේදී කාචයෙහි කාර්යය ලියන්න.

..............................................................................................

V. මානව ප්‍රකාශ සංවේදී සෛල ආකාර 2 ලියන්න.

..............................................................................................

**C.**

I. මානව ශුක්‍ර තරලය යනු කුමක්ද?

..............................................................................................

..............................................................................................

II. වෘෂණවල මූලික ජන්මාණු සෛල මගින් පියවර ගණනාවකදී ශුක්‍රාණු ඇති කෙරේ. මෙම පියවර අනුපිළිවෙල ලියන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

III. ඩිම්භ කෝෂයෙන් ඩිම්භය මෝචනය වන විට ඩිම්භය පවතින අවස්ථාව කුමක්ද?

..............................................................................................

IV. ඩිම්බය සංසේචනය නොවුවහොත් පීත දේහයට කුමක් සිදුවේද?

..............................................................................................

V. අන්ඩෝද්භවයේ,

f. ඌනනය I සිදුවන අවස්ථාව ලියන්න.

..............................................................................................

g. ඌනනය II සිදුවන අවස්ථාව ලියන්න.

..............................................................................................

**04. A.**

I. විකෘතියක් යනු කුමක්ද?



Click & Join Our Telegram Channel

.......................................................................................................................................

II. පහත සඳහන් වර්ණදේහ විකෘති ආකාර සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

a. ලෝපය

.......................................................................................................................................
.......................................................................................................................................

b. ද්විකරණය

.......................................................................................................................................
.......................................................................................................................................

c. පරිසංක්‍රමණය

.......................................................................................................................................
.......................................................................................................................................

III. ජාන විකෘති මඟින් මානව ගහණයේ ඇතිවන ප්‍රවේණික ආබාධ 2ක් නම් කරන්න.

.......................................................................................................................................
.......................................................................................................................................

IV. වර්ණදේහ සංඛ්‍යාව වෙනස්වීම නිසා මානව ගහණයේ ඇතිවන ප්‍රවේණික ආබාධ 3ක් නම් කරන්න.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

V. ක්ලයින් ෆෙල්ටර් සහලක්ෂණය දරන අයගේ සෛලයක වර්ණදේහ ගණන කීයද? ..........................

B.

I. ක්ලෝන වාහක යනු කවරේද?

.......................................................................................................................................
.......................................................................................................................................

II. cDNA පුස්තකාල යනු කවරක්ද?

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

III. සෛලයක් තුලට ආගන්තුක DNA ඇතුළු කිරීමට භාවිතා කරන ක්‍රම ලියන්න.

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

IV. නිරෝධ/සීමා සිතියම් යනු කවරේද?

.......................................................................................................................................
.......................................................................................................................................

V. DNA පිටපත් සෑදීමේදී පහත සඳහන් අවස්ථා පැහැදිලි කරන්න.

a. ජීවස්ථව

.......................................................................................................................................
.......................................................................................................................................



Click & Join Our Telegram Channel

b. නාලස්ථව

................................................................................................................................................

................................................................................................................................................

C.

I. වෛරොයිඩයක් යනු කුමක්ද?

................................................................................................................................................

................................................................................................................................................

II. ව්‍යාධිජනක ආසාදනයකදී සිදු කරන ආක්‍රමණකතාවය යනු කුමක්ද?

................................................................................................................................................

................................................................................................................................................

................................................................................................................................................

III. බහිෂ්ධූලක හා අන්තඃධූලක අතර වෙනස්කම් 3 ක් ලියන්න.

| බහිෂ්ධූලක | අන්තඃධූලක |
|---|---|
| | |
| | |
| | |

IV. පහත සඳහන් රෝග මානවයාගේ කවර පද්ධතිවලට අහිතකර බලපෑම් ඇතිකරයිද?

c. පිටගැස්ම ........................................................................

d. ජලභීතිකාව ........................................................................

e. ලෙප්ටොස්පයිරෝසියාව ........................................................................

f. AIDS ........................................................................

g. කොලරාව ........................................................................

h. රූමැටික උණ ........................................................................

V. නයිට්‍රජන් චක්‍රයේ නයිට්‍රීහරණය යනු කුමක්ද?

................................................................................................................................................

................................................................................................................................................

................................................................................................................................................



Click & Join Our Telegram Channel

සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු ඇගයීම - 2026 (ජූනි-ජූලි)
General Certificate of Education (Adv.Level) Practice Assessment – 2026 (June-July)

ජීව විද්‍යාව II
Biology II

09 S II

ශ්‍රේණිය - 13
Grade - 13

## B කොටස - රචනා

උපදෙස් :
- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- අවශ්‍ය තැන්හිදී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150කි.)

5. සුන්‍යෂ්ටික සෛලවල සිදුවන වායුගෝලීය ඔක්සිජන් රහිතව සිදුවන ශක්තිය නිපදවීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

6.
   a. *Sargassum* හි ලාක්ෂණික ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.
   b. බීජ නොදරන සනාල ශාක වල සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.

7.
   a. සාකෝමියරයේ ව්‍යුහය පහදන්න.
   b. සර්පණ සූත්‍රිකා වාදය පැහැදිලි කරන්න.

8.
   a. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර තෙත්බිම් පරිසර පද්ධතිවල ලක්ෂණ විස්තර කරන්න.
   b. ස්වාභාවික ජල ප්‍රභවවලට අපජලය මුදා හැරීමේ බලපෑම පැහැදිලි කරන්න.

9. ස්ත්‍රීන්ගේ ඔසප් චක්‍රය සහ එහි හෝමෝනමය යාමනය විස්තර කරන්න.

10. කෙටි සටහන් ලියන්න.
   a. මිනිස් අග්න්‍යාශය
   b. නිවර්තන කටු කැලෑ
   c. බිහිජනනය

***



Click & Join Our Telegram Channel